නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**12 ශ්‍රේණිය**

## සිංහල විෂයය

## විශේෂණ පද (08 ඒකකය)

විෂය භාර ආචාරිනී - වාසනා පයාගල

1. I. පහත දැක්වෙන නාමපදවලට සුදුසු විශේෂණ පද ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. අහස | ......................... | 2. නින්ද | ......................... |
| 3. නගරය | ......................... | 4. කුරුල්ලා | ......................... |
| 5. මේසය | ......................... | 6. මහල්ලා | ......................... |
| 7. ආහාර | ......................... | 8. හදවත | ......................... |
| 9. විද්‍යාලය | ......................... | 10. කාව්‍යය | ......................... |

II. පහත දැක්වෙන ක්‍රියා පදවලට සුදුසු විශේෂණ පද ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. සිනාසෙයි | ......................... | 2. කොඳුරයි | ......................... |
| 3. හැඬුවාය | ......................... | 4. ලියයි | ......................... |
| 5. බබළයි | ......................... | 6. කියෙව්වේය | ......................... |
| 7. බැලුවාය | ......................... | 8. නටමු | ......................... |
| 9. නිදමි | ......................... | 10. අසුරති | ......................... |

2. පහත දැක්වෙන ඡේද කියවා එහි ඇති නාම විශේෂණ සහිත පද උපුටා දක්වන්න.

I. කුඩා මල් සහිත පට රෙද්දකින් වැසුණු යටිකය ද රැළි නැගුණු සුදු හැට්ටයකින් වැසුණු උඩුකය ද ඇති නන්දා මව ළඟ ම පුටුවෙහි වාඩි වූවා ය. ඇගේ බෙල්ල සරසන ලද්දේ රත්රන් ඇට දෙපටකිනි. දෙඅත් ගොබ රත්රන් කම්බි තුන්පට ඇඹරීමෙන් තනන ලද වළලු දෙකකිනි. සීන් තොල් සඟළින් වැසුණු කුඩාකට, පෙනුමෙන් තියුණු විය.

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

II. දැළි තැවරීමෙන් කළු පැහැ ගැසුණු ලොකු කාකි කොට කලිසමක් විවර වූ දොර පළුවේ එල්ලා තිබිණි. කලිසම් සාක්කුවේ රැඳුණු දැළි වැකුණ නූල් ගුළියක් දොර දිගේ පහතට වැටුණේය. කිලිටි වී ග්‍රීස් තැවරුණු ලොකු කැන්වස් සපත්තු ජෝඩුවක් දොර පඩිය මත තබා තිබුණේය.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

3. පහත දැක්වෙන වාක්‍යවල යෙදී ඇති ක්‍රියා විශේෂණ පද උපුටා දක්වන්න.

1. හැඩ වැඩව ඇඳීමට පැලඳීමට හැකිකමක් නොතිබුණ හෙයින් ඈ චාම් ව ඇන්දා ය, චාම්ව පැළැන්දා ය.
2. ඇගේ සැමියා මහත් සන්තෝෂයකින් නිවසට පැමිණියේ ය.
3. ඇය වහා කවරය ඉරා ලියුම එළියට ගත්තා ය.
4. තම දර්ශනයෙන් තොමෝ ම වශීකෘතව ප්‍රහර්ෂයෙන් ඈ ටික වේලාවක් බලා ගත් වනම බලා සිටියා ය.
5. සැම දෙනෙකු තුළ ම අනුරාගයන් දනා වූ ඈ බලවත් ප්‍රීතියෙන් හා සොම්නසකින් උද්දාම ව නැටුවා ය. (..........)